**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2014**
------------------------------------------

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සහා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ .

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව වත්කමක් භාවිතය සඳහා සුදුසු තත්ත්වයට පත් කළ අවස්ථාවේ සිට ක්ෂය කළ යුතු වුවත්, මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන පාවිච්චි කළ රු.12,399,690 ක් වූ දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය වෙන්කිරීම් කර නොතිබිණි.

**2.2.2** **නොසැසඳු පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය රු.63,319,323 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් 07 ක සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව එම වටිනාකම රු.52,212,838 ක් වුයෙන් රු.11,106,485 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස්කම් වලට හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3** **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | අතුරු අග්‍රිමයක් දෙන ලද කාර්ය නිම කල වහාම පියවිය යුතු වුවත්, අවස්ථා 11 ක දී ලබා දුන් එකතුව රු.135,215 ක අත්තිකාරම් මාස 2 සිට මාස 8 දක්වා ප්‍රමාද වී පියවා තිබුණි.. |
| (ii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ නමුත් උපලබ්ධි නොවූ මාස 06 ඉක්ම වූ එකතුව රු.50,000 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. . |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.162,853 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,157,429 ක අතිරික්තය වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,320,282 ක පිරිහීමක් දක්නට ලැබුණි. පසුගිය වර්ෂයට

සාපේක්ෂව රජයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන වල සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කළද පෞද්ගලික පඩිනඩි රු.4,777,800 කින් සහ නඩත්තු වියදම් රු.1,067,604 කින් වැඩි වී තිබීම, මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ මෝස්තර නිර්මාණකරුවන් 10 දෙනෙකු සිටින අතර, එක් අයකුට මාසයක් තුල අවම වශයෙන් මෝස්තර 05 ක් නිර්මාණය කළයුතු බවට ඉලක්කයන් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල නිර්මාණ 660 නිමකර තිබූ අතර එයින් 547ක් වැඩහල වෙත හා 113 ක් බාහිර ශිල්පීන් වෙත ලබා දී තිබුණි. එහෙත් මෙම නිර්මාණ වලින් කොපමණ ප්‍රමාණයක් ශිල්පීන් අතර ප්‍රචලිත කිරීම හා ජනප්‍රිය කිරීම සඳහා වැඩ සටහන් පවත්වා තිබුණේද යන්න පිළිබඳ පසු විපරම් කිරීමට ක්‍රමවේදයන් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා නිර්මාණය කරන ලද නව මෝස්තර කොතරම් ප්‍රමාණයක් රටට ඵලදායක වූවාද යන්න මැනීම ගැටළු සහගත විය.

(ආ) **භෞතික ප්‍රගතිය**
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක කර තිබූ මුළු වැඩ සටහන් 05 කින් වැඩ සටහන් 04 ක අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට මධ්‍යස්ථානය අසමත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | වැඩසටහන/ ක්‍රියාකාරකම | 2014 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කය | 2014 දෙසැම්බර් 31 දිනට ලඟාකර ගත් ඉලක්කය | ලඟාකර ගත් ප්‍රගතියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | ඒකක | ඒකක | |
| (i) | <u>ශිල්පීන් පුහුණුව හා ධාරිතා වර්ධනය</u> | | | |
| | උසස් ජාතික මෝස්තර ඩිප්ලෝමා පාඨමාලාව | 25 | 0 | 0 |
| (ii) | <u>නව මෝස්තර සඳහා වෙළඳපල ප්‍රවර්ධනය</u> | | | |
| | නව නිර්මාණ වෙළඳ ප්‍රදර්ශන | 02 | 01 | 50 |
| | ඉදිරිපත් කළ නව නිර්මාණ ගණන | 600 | 400 | 66 |
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 75 | 36 | 48 |
| | ශිල්ප කෞතුකාගාරය සඳහා හඳුන්වා දුන් නව මෝස්තර සංඛ්‍යාව | 20 | - | 0 |
| (iii) | <u>තොරතුරු, පසු විපරම් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය</u> | | | |
| | අමුද්‍රව්‍ය හා ආදේශන ව්‍යාපෘති | 04 | - | 0 |
| | වෙළඳ පල පරීක්ෂණ වැඩ සටහන් | 02 | 01 | 50 |
| (iv) | <u>උපදේශන සේවා</u> | | | |
| | පුස්තකාල පහසුකම් ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 360 | 111 | 31 |
| | මෝස්තර සංඛ්‍යාව සම්බන්ධිත සේවා | 12 | 07 | 58 |

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩම සහ නත්තරන්පොත ඉඩම ආයතනයට පවරාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** බැංකු ගිණුමකට අදාල බැංකු සැසඳුම් පරීක්ෂාවේදී 2002 වර්ෂයේදී තැන්පත් කරන ලද රු.21,000 ක මුදල විගණිත දිනය දක්වා බැංකුවට බැර වී නොතිබූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**
**------------------------**

එක් නිලධාරිනියකගෙන් සමන්විත අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා විගණකාධිපතිගේ එකඟත්වය ලබා ගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**
**-----------------------------**

මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 102 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 85 ක් වූ අතර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 20 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක් ද විය. නව කාර්ය මණ්ඩලය යටතේ පත්කරනු නොලැබූ ආදේශ නොකළ සේවකයන් 03 ක් ද සේවයේ යොදවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**
**------------------------------------------**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

සමාලෝචිත වර්ෂයට අදාල කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 ජූනි මස 12 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන නැවත විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**
**-----------------------**

මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාර ඉලක්ක ගත පුහුණු වැඩ සටහන් කිහිපයක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණු අතර, ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් නොවූ සම්ප්‍රදායික ගම්මාන ව්‍යාපෘති ගණනාවක් රේඛීය අමාත්‍යාංශයේ ආධාර මත ක්‍රියාත්මක කර තිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**
**--------------------------------**

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 22 සිට සියයට 121 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) මූල්‍ය පාලනය